හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව
නුවරඑළිය දිස්ත්‍රික්කය
---------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
----------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූලි 31 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
--------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම් හැර මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු
-------------------------

(අ) පනංගමුව මාර්ගය ඉදිකිරීමේ ව්‍යාපෘතිය අවසන්වී අවසාන ගෙවීම කර තිබූ නමුත් ව්‍යාපෘතිය සඳහා ගෙවූ රු.399,738 ක අත්තිකාරම් මුදල නිරවුල්කර නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට අත්තිකාරම් රු.399,738 ක් වැඩියෙන් හා වර්ෂයේ වියදම රු.399,738 කින් අඩුවෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විණි.

(ආ) සමාලෝචිත වර්ෂයේ මැයි සිට සැප්තැම්බර් දක්වා කාලයට අදාළ උසාවි දඩ ආදායම් පිළිබඳව සොයාබලා ගිණුම්ගතකර නොතිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාළ මුද්දර ගාස්තු ආදායම නිවැරදිව හඳුනා නොගෙන වර්ෂය තුළ මුදලින් ලැබුණු රු.1,459,950 ක මුද්දර ගාස්තුවලට රු.3,442,550 ක ඇස්තමේන්තුගත ආදායමක් එකතුකර වර්ෂයේ මුද්දර ගාස්තු ආදායම ලෙස රු.4,902,500 ක් ගිණුම්ගතකර තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්
-------------------------

(අ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 02 ක වටිනාකම අදාළ ගිණුම් සහ උපයෝගී ලේඛන සමග සැසඳීමේදී රු.490,436 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට සභාවේ විවිධ තැන්පතු ශේෂය, තැන්පතු ගිණුම් සහ තැන්පතු ලේඛන අනුව සැසඳීමේදී රු.1,783,461 ක වෙනසක් නිරීක්ෂණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්
---------------------------------------

1.3.3.1 ලැබිය යුතු ගිණුම්
--------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට කර්මාන්ත ණයගැති ශේෂය රු.34,338,905 ක් වූ අතර, ඉන් රු.21,275,427 ක් වසරක කාලයක් ඉක්මවා අය නොවී පැවතුණි.

1.3.3.2 ගෙවිය යුතු ගිණුම්
---------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂය රු.24,464,702 ක් වූ අතර, ඉන් රු.11,653,009 ක් වසර 01 ක කාලයක් ඉක්මවා තිබුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොවීම
---------------------------------------------------

සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රයේ දක්වා ඇති රු.121,344,173 ක ගිණුම් විෂයයන් 08 ක් සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි ඉදිරිපත් නොකිරීම නිසා ඒවා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම
--------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම
--------------------------------------------------------------------------

නිකුත්කර ගෙවීම සඳහා බැංකුවට ඉදිරිපත් නොකළ මාස 06 ඉක්මවූ රු.19,095 ක චෙක්පත් 07 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 396(ඇ) සහ මධ්‍යම පළාත් මූල්‍ය රීති 283.4 අනුව කටයුතු කර නොතිබුණි.

2. මූල්‍ය සමාලෝචනය
------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.3,015,791 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.9,962,267 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
-----------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම් , රැස්කළ ආදායම් හා හිඟ ආදායම්
------------------------------------------------------------------------------------------

සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාළව ඉදිරිපත්කර තිබුණු ඇස්තමේන්තුගත ආදායම්, බිල්කළ ආදායම්, රැස්කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | බිල්කළ ආදායම | රැස්කළ ආදායම | දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 4,896,800 | 2,703,632 | 1,706,199 | 2,368,977 | 1,808,500 | 1,812,744 | 644,335 | 2,218,065 |
| කුලී | 6,123,900 | 4,778,602 | 5,757,863 | 2,365,402 | 4,071,400 | 5,026,759 | 3,625,216 | 1,780,575 |
| බලපත්‍ර ගාස්තු | 2,633,100 | 2,546,313 | 2,546,313 | - | 19,860,500 | 2,660,504 | 2,660,504 | - |
| වෙනත් ආදායම් | 7,063,500 | 7,557,952 | 3,370,351 | 6,088,369 | 7,303,800 | 9,973,676 | 2,735,217 | 8,669,510 |

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

(අ) සමාලෝචිත වර්ෂය ආරම්භයේ පැවති රු.4,333,407 ක් වූ වරිපනම් බදු, කඩකුලී හා ජල ගාස්තු හිඟයෙන් වර්ෂය අවසානය වන විට රු.1,322,388 ක් පමණක් අයකර තිබුණු බැවින් හිඟ ආදායම් අයකිරීම් සතුටුදායක නොවීය.

(ආ) සමාලෝචිත වර්ෂයේ වරිපනම් බදු, කඩකුලී සහ ජල ගාස්තු බිල්කිරීම රු.5,297,536 ක් වූ අතර, එම බිල්කිරීම් වලින් වර්ෂය අවසාන වන විට රු.3,504,313 ක් පමණක් අයකර තිබුණි.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුඛ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කාර්තවයන් ඉටුකිරීම පිළිබඳව අනාවරණය වූ කරුණු පහත දැක්වේ.

(අ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

සභා බලප්‍රදේශයේ ජනතාව අතර කසළ කළමනාකරණය සඳහා බෙදාහැරීම පිණිස 2016 සහ 2017 වර්ෂවලදී විවිධ මිල ගණන්වලට රු.1,081,454 ක් වටිනා කොම්පෝස්ට් බඳුන් 310 ක් මිලදී ගෙන තිබුණද ඒවායින් බඳුන් 224 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විට බෙදාහැර නොතිබුණි. එමෙන්ම වර්ෂ 02 කදී විවිධ මිල ගණන්වලට මිලදී ගෙන තිබුණු එම ඉතිරි බඳුන්වල වටිනාකමද ගණනය කළ නොහැකි විය.

(ආ) පාරිසරික ගැටළු

-------------------

සභා බලප්‍රදේශය තුළ එකතුකරනු ලබන කසළ උපයෝජනය කර ගනිමින් කාබනික පොහොර නිෂ්පාදනය නොකර එම කසළ පස්දමා වැසීම සිදුකරමින් පැවතුණු අතර, කසළ මධ්‍යස්ථානයට රැගෙන එන අපිරිසිදු පොලිතින් ගිනිතබා විනාශ කරන බවද නිරීක්ෂණය විය.

(ඇ) තිරසර සංවර්ධන ඉලක්ක

------------------------------

තිරසර සංවර්ධන අරමුණු හා ඉලක්ක පිළිබඳව ප්‍රාදේශීය සභාව ප්‍රමාණවත්ව දැනුවත් වී නොතිබුණු අතර, ඒ සම්බන්ධයෙන් ප්‍රමාණවත් කාර්යභාරයක් සමාලෝචිත වර්ෂය තුළ ඉටුකර නොතිබුණි.

3.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

(අ) 2000 අංක 53 සහ 1988 අංක 56 දරන පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරන ජාතික පාරිසරික පනත සහ ඒ යටතේ බලපවත්වන ලද රෙගුලාසිවලට අනුකූලව නිකුත් කර ඇති 2008 ජනවාරි 25 දිනැති අංක 1523/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය අනුව පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබාගෙන ඇති ව්‍යාපාර 14 ක බලපත්‍රවල වලංගු කාලය අවසන්වී තිබුණද නව බලපත්‍ර නිකුත් කර නොතිබුණි.

(ආ) 1998 වර්ෂයේ පළාත් පාලන අමාත්‍යාංශයෙන් සභාවට ලබාදී තිබුණු කැබ් රථයක් සඳහා 1998 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා ආදායම් බලපත්‍ර ලබාගෙන නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

----------------------------

3.3.1 නඩත්තු හා අලුත්වැඩියා සිදුනොකිරීම

-------------------------------------------

(අ) මතුරට උපකාර්යාලයට අයත් මහජන පුස්තකාලය සඳහා අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත්ව සපයා නොතිබුණු අතර නඩත්තු කටයුතුද මනාව කර නොතිබුණි.

(ආ) රිකිල්ලගස්කඩ පොදු වෙළඳපල ගොඩනැගිල්ල සඳහා අවශ්‍ය විදුලි සහ ජල පහසුකම් සපයා නොතිබුණු අතර, ගොඩනැගිල්ල නිසි පරිදි නඩත්තු කර හෝ අලුත්වැඩියා කර හෝ නොතිබුණි.

(ඇ) රිකිල්ලගස්කඩ උපකාර්යාලයට අවශ්‍ය පහසුකම් ප්‍රමාණවත්ව සපයා නොතිබුණු අතර, උපකාර්යාල ගොඩනැගිල්ලේ වහලයද අලුත්වැඩියා කළ යුතු තත්ත්වයේ පැවතුණි.

3.3.2 නිෂ්ක්‍රීය/ ඌන උපයෝජිත වත්කම්

---------------------------------------

පළාත් සභා මන්ත්‍රී ප්‍රතිපාදන උපයෝගී කරගෙන 2017 වර්ෂයේදී රු.642,312 ක් වැයකර ඉදිකර තිබුණු උඩවත්තකුඹුර නව ගම්මානයේ පානීය ජල ටැංකිය සඳහා ජලය රැගෙන එන සහ ජලය බෙදාහරින නල මාර්ග විධිමත්ව ඉදිකර නොතිබුණු අතර, ජල ටැංකිය මහජනතාවගේ ප්‍රයෝජනය සඳහා යොදා ගෙන නොතිබුණි.

4. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ලේඛනය අනුව ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් සමඟ සැසඳීමේදී ආදායම් විෂයයන් 06 ක සියයට 10 සිට සියයට 67 ක් දක්වාද, වියදම් විෂයයන් 04 ක සියයට 42 සිට සියයට 98 ක් දක්වාද විචලනයන් නිරීක්ෂණය වූ බැවින් අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

5. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණ වූ අඩුපාඩු වරින්වර සභාවේ අවධානයට යොමුකර ඇති අතර, පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය

| පද්ධතිය | අඩුපාඩුව |
|---|---|
| ආදායම් | හිග ආදායම් අයකර නොගැනීම |
| ණයගැති/ ණයහිමි | පැරණි ශේෂ නිරවුල් නොකිරීම |
| වත්කම් | (I) ප්‍රශස්ත ලෙස උපයෝජනය නොකිරීම |
| | (II) මනාව නඩත්තු අලුත්වැඩියා කටයුතු සිදු නොකිරීම |